# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 485/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 19/03/2024 පැය 1730

## මාධ්‍ය නිවේදනය

### සංවිධානාත්මක අපරාධ මැඩපැවැත්වීමේ විශේෂ මෙහෙයුම ආරම්භ කිරීම - පොලිස් මූලස්ථානය.

2024.03.19 වන අද දින උදෑසන අපරාධ වාර්තා කොට්ඨාසයේදී සංවිධානාත්මක අපරාධ මැඩපැවැත්වීමේ විශේෂ මෙහෙයුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් අදාල නිලධාරීන්ව පූර්ණ දැනුවත් කිරීමක් සිදු කරන ලදී. යුක්තිය මෙහෙයුමට සමගාමීව, සංවිධානාත්මක අපරාධ කල්ලි මැඩපැවැත්වීමේ අරමුණින් සිදු කරනු ලබන මෙම විශේෂ මෙහෙයුමට පොලිස් හා පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන්ගෙන් සමන්විත විශේෂ පොලිස් කණ්ඩායම් 20ක් යෙදවීමට කටයුතු කර ඇත.

මෙම කණ්ඩායම් විසින් බස්නාහිර පළාත හා දකුණු පළාත මූලික කරගනිමින් විශේෂ මෙහෙයුම් සිදු කිරීමට නියමිතව ඇත. සංවිධානාත්මක අපරාධකරුවන් විසින් සිදුකරනු ලබන විවිධ අපරාධ හා මත්ද්‍රව්‍ය ජාවාරම් මැඩලීම, ඔවුන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් මහජනතාවට සිදුවන අපහසුතාවයන් වැලැක්වීම, මෙම විශේෂ මෙහෙයුමේ මූලික අරමුණ වේ. එමෙන්ම මේ වන විට හඳුනාගෙන ඇති සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහාද මෙම විශේෂ පොලිස් කණ්ඩායම් 20 මගින් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

අදාල පොලිස් කණ්ඩායම් 20 හි නිලධාරීන් පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයට කැඳවා පොලිස්පතිතුමා විසින් ඔවුන් වෙත වැඩිදුරටත් උපදෙස් ලබා දීමෙන් අනතුරුව එම නිලධාරීන් අද දිනම මෙම විශේෂ මෙහෙයුම සඳහා පිටව යන ලදී.

මෙම අවස්ථාවට පොලිස් විශේෂ කාර්ය බලකා අණදෙන නිලධාරී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතා, දකුණු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහේෂ් සේනාරත්න මහතා, අපරාධ හා රථවාහන භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රන්මල් කොඩිතුවක්කු මහතා, අපරාධ දිසාව හා පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නිහාල් තල්දූව මහතා ඇතුළු උසස් පොලිස් නිලධාරීන් රැසක් මෙම අවස්ථාවට සහභාගී විය.


POLICE
VO-6204


POLICE






TV
NEWS





මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.